සියලු හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

නර්තනය	(දේශීය)	I
நடனம்	(தேசிய)	I
Dancing	(Indigenous)	I

52 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : .....

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

පිටු අංකය	ප්‍රශ්න අංක	ලකුණු
01	01 - 03	
02	04 - 13	
03	14 - 20	
04	21 - 32	
05	33 - 42	
06	43 - 50	
එකතුව		

	අත්සන	සංකේත අංකය
1 වන පරීක්ෂක		
2 වන පරීක්ෂක		
අති. ප්‍රධාන පරීක්ෂක		
ගණිත පරීක්ෂක		
ප්‍රධාන පරීක්ෂක		

උපදෙස්:

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

● අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

1. පා සරඹ / මණ්ඩි පද සහ ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද නර්තනය කිරීමේ මූලික පරමාර්ථය වන්නේ,
(1) නර්තන ශක්‍යතා ප්‍රදර්ශනය කිරීම ය.
(2) ශරීර සම්බරතාව ගොඩනැඟීම ය.
(3) නිවැරදි ආංගහාර සකස් කිරීම ය.
(4) විවිධ පැනීම්, කැරකීම් පුහුණු කිරීම ය.
(5) නර්තනයේ වේගය පුහුණු කිරීම ය. (.....)

2. කොතල පදය / කෙණ්ඩි පාළිය නර්තනය කිරීමෙන්,
(1) ගායන රහිත නර්තන කුසලතා වර්ධනය කරගත හැකි ය.
(2) පූජා භාණ්ඩ නිවැරදිව හසුරුවමින් නර්තන ශක්‍යතාව වර්ධනය කරගත හැකි ය.
(3) නිවැරදි අංගහාර අනුගමනය කරමින් තාලාත්මක නර්තන හැකියාව වර්ධනය කරගත හැකි ය.
(4) රංග කරළියෙහි පැන් ඉසිමින් එහි පවිත්‍රතාව වර්ධනය කරගත හැකි ය.
(5) ඒකල නර්තන හැකියාව සහ දේව ආශීර්වාදය ළඟා කරගත හැකි ය. (.....)

3. තුන් සුළු දෙමහ පස්නිත විභාග කොට දැක්විය හැකි වරණය තෝරන්න.
(1) $\hat{1}2 / \hat{1}2 / \hat{1}2 / \acute{1}23 / \acute{1}23$
(2) $\acute{1}2 / \acute{1}2 / \acute{1}2 / \hat{1}234 / \hat{1}234$
(3) $\hat{1}23 / \hat{1}23 / \hat{1}23 / \acute{1}234 / \acute{1}234$
(4) $\acute{1}23 / \acute{1}23 / \acute{1}23 / \hat{1}234 / \hat{1}234$
(5) $\hat{1}2 / \hat{1}2 / \hat{1}2 / \acute{1}234 / \acute{1}234$ (.....)

CamScanner

Past Papers Wiki

4. දැන පෙරළා බෙර වාදනය ත්‍රුරුවීමට වඩාත් යෝග්‍ය වාද්‍ය භාණ්ඩ වන්නේ,
(1) ගැටබෙරය සහ දවුල ය.
(2) ගැටබෙරය සහ උඩැක්කිය ය.
(3) පහතරට බෙරය සහ තම්මැට්ටම ය.
(4) පහතරට බෙරය සහ උඩැක්කිය ය.
(5) ගැටබෙරය සහ පහතරට බෙරය ය. (.....)

5. උඩැක්කි හා පන්තේරු කවි අයත් වන්නේ කුමන ගණයට ද?
(1) ගැමි ගී (2) සේ ගී
(3) මෙහෙ ගී (4) ශාන්තිකර්ම ගී
(5) කෙළි ගී (.....)

6. "සිරස බඳින ජටා සතර පළමු ලේ විලේ ....." මෙම කවිය කිනම් චරිතයකට අයත් ද?
(1) රිරී යකා (2) තොට යකා
(3) කළු යකා (4) අභිමානා
(5) මහසෝනා (.....)

7. චලනයෙහි ස්වභාවය වෙනස්වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක වන්නේ,
(1) ශක්තිය, චලනය, දුර සහ වේගයයි.
(2) ශක්තිය, කාලය, දුර සහ වේගයයි.
(3) ශක්තිය, සම්බරතාව, කාලය සහ දුරයි.
(4) සම්බන්ධතා, කාලය, චලනය සහ බරයි.
(5) අවකාශය, සම්බන්ධතා, වේගය සහ දිශායි. (.....)

8. වලියක් මංගල්‍යයේදී සිදු **නොවන** චාරිත්‍රයක් වන්නේ,
(1) ගරා වෙස් පෑමයි. (2) බලි බත් දීමයි.
(3) පරහඳ ගැමයි. (4) ඇහැළ කණුව සිටුවීමයි.
(5) කප් සිටුවීමයි. (.....)

9. සන්නි යකුම් යාගයේ ප්‍රධාන රංග මණ්ඩපය හඳුන්වන නාම ලෙස සැලකෙන්නේ,
(1) සන්නි යකුම් විදිය, ලිච්ඡවි විදිය සහ සංඛපාල විදියයි.
(2) සන්නි යකුම් විදිය, සංඛපාල විදිය සහ කපාල විදියයි.
(3) සන්නි යකුම් විදිය, තොරන් විදිය සහ කපාල විදියයි.
(4) තොරන් විදිය, ලිච්ඡවි විදිය සහ සංඛපාල විදියයි.
(5) තොරන් විදිය, සුනියම් විදිය සහ කඩවර විදියයි. (.....)

10. "නෘත්‍ය ගීත වාදනය කෙරෙනි. සිනාසෙති. ඔවුහු බෝධිය පිරිවරා ගත්තාහු ....." ආදී වශයෙන් ශ්‍රී මහ බෝධීන් වහන්සේට පුද පූජා පැවැත්වූ ආකාරය සඳහන් වංශ කතාව කුමක් ද?
(1) චූලවංශය (2) ධාතුවංශය
(3) ථූපවංශය (4) දීපවංශය
(5) එළඅත්තනගලුවංශය (..... ..)

11. ටුකඩා සහ පරන් නර්තනාංග වේදිකාවට නිර්මාණය කොට ප්‍රදර්ශනය කරන ලද්දේ,
(1) නවාබ් චිජිඩ් අලීෂා ය. (2) කාල්කා ප්‍රසාද් ය.
(3) අච්චන් මහරාජ් ය. (4) ජීනදාස වික්‍රමසිංහ ය.
(5) බිර්ජු මහරාජ් ය. (.....)

12. හින්දුස්ථානි තාල පද්ධතියෙහි කෙහෙර්වා තාලයට අයත් මාත්‍රා ගණන
(1) 06 කි. (2) 08 කි.
(3) 10 කි. (4) 12 කි.
(5) 16 කි. (... ...)

13. නර්තනය පිළිබඳ තොරතුරු දැක්වෙන ගම්පොළ සහ කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය වන්නේ පිළිවෙළින්
(1) මයුර සහ පරෙවි ය. (2) පරෙවි සහ සැලළිහිණිය ය.
(3) තිසර සහ මයුර ය. (4) මයුර සහ තිසර ය.
(5) කෝකිල සහ සැවුල් ය. (.....)


CamScanner

14. "වීරමුණ්ඩ දෙවි වඩින්න - සියලු දෝෂ දුර හරින්ඩ ....." මෙම කවිය අයත් වන්නේ,
(1) කොහොඹා හෑල්ලට ය. (2) මඩුපුරයට ය.
(3) අස්නෙට ය. (4) කෝල්මුරවලට ය.
(5) මල් පදයට ය. (.....)

15. පහත A සහ B රූප දක්නට ලැබෙන්නේ පිළිවෙළින්,



A



B

(1) බෙන්තොට ගලපාත විහාරයේ සහ ඇම්බැක්ක දේවාලයේ ය.
(2) සැටදාගෙහි සහ ලෝවාමහපාය කණු හිස්වල ය.
(3) ලෝවාමහපාය කණු හිස්වල සහ බෙන්තොට ගලපාත විහාරයේ ය.
(4) මැදිරිගිරිය වටදාගෙයහි සහ බෙන්තොට ගලපාත විහාරයේ ය.
(5) ගඩලාදෙණිය විහාරයේ සහ ඇම්බැක්ක දේවාලයේ ය. (.....)

16. හස්තං දෘෂ්ටි මුඛං පාදං - තාලාංච ගමනං තථා .....
යනුවෙන් නර්තනය පිළිබඳ විග්‍රහ කර ඇත්තේ කවුරුන් විසින් ද?
(1) නන්දිකේශ්වර (2) භරතමුනි
(3) අභිනවගුප්ත (4) ආනන්දවර්ධන
(5) ධනංජය (.....)

17. තාල ශාස්ත්‍රය පිළිබඳ 1994 වර්ෂයේදී ප්‍රකාශිත කෘතිය සහ එහි කතුවරයා කවුරුන් ද?
(1) හෙළ ගී මග – ඩබ්ලිව්. බී. මකුලොලුව්
(2) සිංහල නර්තන කලාව – මුදියන්සේ දිසානායක
(3) සිංහල තිත් තාල ක්‍රමය – සරත් විජේවර්ධන
(4) නෘත්‍ය රත්නාකරය – ජේ. ඊ. සේදරමන්
(5) තාල ඥානය – වින්සන්ට් සෝමපාල (.....)


18. කෝලම් මඩුවේ කරළියට එන නොන්බි අක්කාගේ දරු දෙදෙනා කවු ද?
(1) චුක්කිනියා සහ සොන්තානා (2) හෙංචප්පු සහ දුක්කිනියා
(3) චුක්කිනියා සහ පරයා (4) චුක්කිනියා සහ ඩිංගුරුවා
(5) ඩිංගුරුවා සහ පරයා (.....)

19. "ඒ බුදු රැස් කද තුන් ලොව විහිදූ - ඒ බුදු මඟුලට ආ සැම දෙවිඳූ ..." මෙම කවිය
(1) උඩැක්කි කවියකි. (2) පන්තේරු කවියකි.
(3) ලී කෙළි කවියකි. (4) පෙළුම් කවියකි.
(5) වරම් කවියකි. (.....)


20. රුක්මණී දේවි අරුන්ඩෙල් විසින් නර්තනය ඉගැන්වීම සඳහා ආරම්භ කරන ලද ආයතනය කුමක් ද?
(1) නෘත්‍යග්‍රාම් (2) කලා ක්ෂේත්‍ර
(3) විශ්ව භාරති (4) කේරළ කලා මණ්ඩලම්
(5) භාණ්ඩන්ඩේ (.....)

CamScanner

21. පහත A සහ B රූපවලින් දැක්වෙන රංගාභරණ පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.



A



B

(1) හස්ත කඩය සහ ගිනි සිළුව
(2) උරබාහු සහ ජටාව
(3) කන්පෙත්ත සහ ශීර්ෂාභරණය
(4) තෝඩුපත් සහ ශිබාබන්ධනය
(5) තෝඩුපත් සහ පායිම්පත (.....)

22. නිත්තවෙල ගුණයා සහ ප්‍රේම කුමාර එපිටවෙල විසින් නර්තන නිර්මාණය කළ නවතම වත්නම් දර්ශන පිළිවෙළින්,
(1) ඇඟලුම් සහ ගුරුදේව ය.
(2) මරඹන සහ මහබෝ ය.
(3) ආයිත්නා සහ නලඟන ය.
(4) සමනළ සහ හංස ය.
(5) මහබෝ සහ හංස ය. (.....)

23. ආඬ්ගුරු නැටීම සහ මංගර උපන් තනා අන්තර්ගත සබරගමු නර්තන සම්ප්‍රදායයේ ශාන්තිකර්මය ලෙස සැලකෙන්නේ,
(1) කඩීනා බලියයි.
(2) උයන්ඟන පිදිල්ලයි.
(3) කිරි මඩුවයි.
(4) පහන් මඩුවයි.
(5) ගී මඩුවයි. (.....)

24. කථක් නර්තන සම්ප්‍රදායයේ භාවිත කළ පැරණි තාල වාද්‍ය භාණ්ඩය සහ ස්වර වාද්‍ය භාණ්ඩය කුමක් ද?
(1) තබ්ලාව සහ වයලීනය
(2) තබ්ලාව සහ හාර්මෝනියම්
(3) පඛාවාජ් සහ වයලීනය
(4) පඛාවාජ් සහ සාරංගිය
(5) මෘදංගය සහ සිතාරය (... ...)

25. අංග, ප්‍රත්‍යාංග සහ උපාංග භාවිතයට ගනිමින් වාචික අභිනයෙන් තොරව කිසියම් තනාවක් හෝ අවස්ථාවක් නිරූපණය කෙරෙනුයේ,
(1) ශෛලිගත නාට්‍ය මඟිනි.
(2) තාන්ත්‍රික නාට්‍ය මඟිනි.
(3) මුද්‍රා නාට්‍ය මඟිනි.
(4) ලෝක ධර්මී නාට්‍ය මඟිනි.
(5) නාට්‍ය ධර්මී නාට්‍ය මඟිනි. (.....)

● අංක **26** සිට **35** තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට වඩාත් සුදුසු වචන/වචනය යොදන්න.

26. සබරගමු සම්ප්‍රදායේ ගොපලු කුරුම්බර සමඟ දොළොස් කුරුම්බර පුද ලබන්නේ .... ශාන්තිකර්මයේදී ය.

27. මුදලි කෝලමේදී තල් අත්ත අල්ලන්නේ ..... නම් සේවකයා විසිනි.

28. අත් උදව්කරුවා හෙවත් අතෝරකරුවා, සබරගමු සම්ප්‍රදායේදී ..... නමින් හැඳින්වේ.

29. "පහනරට සින්දු වත්නම් විමර්ශනය" කෘතිය රචනා කරන ලද්දේ .. .. විසිනි.

30. සන්නියකුම ශාන්තිකර්මයේදී අවසානවරට සභාගත වන්නේ ..... සන්නියයි.

31. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සෞන්දර්ය විෂය අනිවාර්ය වූයේ .... වර්ෂයේදී ය.

32. දෙවොල් දෙවියන් ලක්දිවට පැමිණි නැවේ කුඹගස සිහිවීම පිණිස දෙවොල් මඩුවේදී ..... සිටුවනු ලබයි.


33. ටුම්පි යනු ..... රසය තීව්‍ර කරන තර්තනාංගයකි.

34. "ඒ වේදේහ රජුගේ විධානයෙන් අතක විතත විතතාතත ..." යන පාඨය සඳහන් වන්නේ .... නම් කෘතියේ ය.


35. රතු සහ නිල් වර්ණ එක්වීමෙන් ..... වර්ණය නිර්මාණය වේ.

● අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **සිත් ඉර** මත ලියන්න.

36. **A** සහ **B** රූපවලින් දැක්වෙන ශාන්තිකර්ම සැරසිලි **දෙක** නම් කරන්න.



A



B

(i) A : .....

(ii) B : .....

37. රබීන්ද්‍රනාත් තාගෝර්තුමා ඇතුළු පිරිස විසින් ප්‍රථමවරට ශ්‍රී ලංකාවේ ඉදිරිපත් කරන ලද නෘත්‍ය නාටකය සහ එය ඉදිරිපත් කරන ලද වර්ෂය කුමක් ද?

(i) නෘත්‍ය නාටකය : .....

(ii) වර්ෂය : .....

38. භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව 'විභාව' කොටස් දෙකකින් යුක්ත ය. ඒ මොනවා ද?

(i) .....

(ii) .....

39. භරත නාට්‍යයම් ශිල්පිනියකගේ ඉනෙහි සහ උරබාහුවල පලඳින ආභරණ නම් කරන්න.

(i) ඉන : .....

(ii) උරබාහු : .....

40. වීරියක් චරිතය වෙස් ගැන්වීමේදී භාවිත ප්‍රධාන වර්ණය සහ රංග භාණ්ඩය කුමක් ද?

(i) ප්‍රධාන වර්ණය : .....

(ii) රංග භාණ්ඩය : .....

41. ශරීරය දරදඬු වීම සහ දහඩිය දැමීම යන සාත්වික භාව හඳුන්වන නාම **දෙක** ලියන්න.

(i) ශරීරය දරදඬු වීම : .....

(ii) දහඩිය දැමීම : .....

42. "සිරිවස ගෙන අසු නැගෙමින් නොලෙසා..." මෙම කවි පදයෙහි ලඝු සහ ගුරු මාත්‍රා සංඛ්‍යාව ලියන්න.

(i) ලඝු : .....

(ii) ගුරු : .....

Past Papers Wiki
PAST PAPERS WIKI
CamScanner

43. සෞන්දර්ය ගුරු විදුහල ස්ථාපිත කළ ස්ථානය සහ වර්ෂය කුමක් ද?

(i) ස්ථානය : .....

(ii) වර්ෂය : .....

44. ටික්කා සීපදයක ව්‍යුහය සැකසී ඇති ප්‍රධාන කොටස් **දෙක** ලියා දක්වන්න.

(i) .....

(ii) .....

45. බෙර වාදනයේදී භාවිත අවනද්ධාක්ෂර වර්ග **දෙක** නම් කරන්න.

(i) .....

(ii) .....

46. නිදි කුමරිය බැලේ නිර්මාණය ප්‍රථමවරට රඟදක්වන ලද වර්ෂය සහ නගරය ලියන්න.

(i) වර්ෂය : .....

(ii) නගරය : .....

47. ශිවරංග ස්ත්‍රී සිත්ත බත යන මුද්‍රා නාට්‍ය නිර්මාණය කළ ශිල්පීන් දෙදෙනා කවුද?

(i) ශිවරංග : .....

(ii) සිත්ත බත : .....

48. මහ පරාක්‍රමබාහු සහ නිශ්ශංකමල්ල රජවරුන් නර්තනය උදෙසා ඉදිකළා යැයි සැලකෙන රංග මණ්ඩප **දෙක** නම් කරන්න.

(i) මහ පරාක්‍රමබාහු රජු : .....

(ii) නිශ්ශංකමල්ල රජු : .....


● අංක 49 සහ 50 ප්‍රශ්නවලට පහත දැක්වෙන A, B, C, D රූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.



A



B



C



D

49. ඉහත **A** සහ **B** රූපවල දැක්වෙන තාල තැබීමට උපයෝගී කරගන්නා ගෘහෝපාද්‍ය භාණ්ඩය සහ රංගාභරණය කුමක් ද?

(i) **A** : .....

(ii) **B** : .....

50. ඉහත **C** සහ **D** රූපවල දැක්වෙන රංගාභරණය සහ රංග භාණ්ඩය නම් කරන්න.

(i) **C** : .....

(ii) **D** : .....

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank

CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

නර්තනය	- (දේශීය)	II
நடனம்	- (தேசிய)	II
Dancing	- (Indigenous)	II

52 S II

විභාග පාලන ඒකකයේ භාවිතය සඳහා පමණි

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් **අවම වශයෙන් එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරා නිවැරදිව ප්‍රස්තාර කරන්න.

(අ) ගොග් ගොග් ජීං ජීං ගත

(ආ) දිත්තම් දිතකු දොම් දොම් තාම්

(ඉ) කුඳත් තක්කිට තකිට ජිමිතකු

(ii) පහත දැක්වෙන කවි පදය මැදුම් මහ දෙතිතට ප්‍රස්තාර කරන්න.

තුරු රත්න සිරි ලෙසිනා තිලිණ නෙක
දෙන නිත්‍ය සන්තොසිනා

(iii) ගණපති වන්නමේ අඩව්ව හෝ ලලිතරාග තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ තිසරා වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාරගත කරන්න.

2. ශ්‍රී ලාංකේය නර්තන සහ වාදන කලාවේ විකාසනය පිළිබඳ අධ්‍යයනයේදී ඓතිහාසික මූලාශ්‍රය වැදගත් වේ.

(i) කුරුණෑගල යුගයේ සාහිත්‍ය මූලාශ්‍රය **දෙකක්** ඇසුරෙන් තූර්ය වාදන කලාව පිළිබඳ පිරික්සන්න.

(ii) පොලොන්නරු යුගයේදී නර්තන කලාව සඳහා රාජ අනුග්‍රහය ලැබී ඇති බව මූලාශ්‍රය **දෙකක්** ඇසුරෙන් තහවුරු කරන්න.

(iii) මහනුවර යුගයේ නර්තන කලාවේ ස්වභාවය පහත සඳහන් විදේශිකයන්ගේ ලේඛන ඇසුරෙන් විමසන්න.

(අ) ස්පිල් බර්ජන්

(ආ) රොබට් නොක්ස්

(ඉ) ජෝන් ඩේව්

Past Papers Wiki

II කොටස

3. (i) 'බලි' යන්නෙහි වචනාර්ථය සාහිත්‍යගත කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) වලියක් මංගල්‍යයට ආවේණික චාරිත්‍ර **දෙකක්** විස්තර කරන්න.

(iii) නානුමුරයේදී වාචික සහ ආහාර්ය අභිනය යොදාගෙන ඇති ආකාරය උදාහරණ සහිතව විමසන්න.

4. (i) උෆරා යක්කමෙන් හෙළිවන තත් කාලීන සමාජ විවරණය කවි **දෙකක්** ඇසුරෙන් පිරික්සන්න.

(ii) මඩුපුරේ කවි සහ ග්‍රහපංති කවි යන ශාන්තිකර්ම ගායනා පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) "ශාන්තිකර්ම කතා පුවත් මගින් බෞද්ධාගමික ඉගැන්වීම් පිළිබිඹු කෙරේ". සන්නියකුම ශාන්තිකර්මයේ උපත් කතා ඇසුරෙන් සාකච්ඡා කරන්න.

5. (i) මෝල්ගස් සහ කුලු නැටුම ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි අනන්‍ය ලක්ෂණ විශද කරයි. පැහැදිලි කරන්න.

(ii) කෝලම් නාටකය මගින් රස නිෂ්පත්තිය සිදුවන ආකාරය මුදලි සහ හෙන්චප්පු චරිත ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(iii) ගැටබෙරය සකස් කිරීමේදී යොදාගන්නා අමුද්‍රව්‍ය සහ භාවිත කරනු ලබන මිනුම් ක්‍රමයන්හි වැදගත්කම අගයන්න.

III කොටස

6. පහත සඳහන් වගුවෙහි **(අ)**, **(ආ)** සහ **(ඉ)** යන කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) කොටස	(ආ) කොටස	(ඉ) කොටස
භරත	ඇමරිකාව	ක්ෂේත්‍රඥ
කථක්	බ්‍රිතාන්‍ය	නාරායන තීර්ත
කථකලි	ප්‍රංශය	ජයදේව
මනිපුරි	රුසියාව	වඩිවේලු

(i) **(අ)** කොටස - උතුරු ඉන්දියානු නර්තන සම්ප්‍රදාය තෝරා එහි කාන්තා රංග වස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කරන්න.

(ii) **(ආ)** කොටස - දහසය වැනි සියවසේ බැලේ නර්තනය ව්‍යාප්ත වූ රට තෝරා එහිදී එම රංග කලාව සංවර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න.

(iii) **(ඉ)** කොටස - භරත නාට්‍යම් සම්ප්‍රදායේ සංගීතඥයා තෝරා ඔහුගේ පරපුර පිළිබඳ විවරණය කරන්න.

7. (i) චරිතාත්මක අංගරචනයේදී වර්ණ, රේඛා හා හැඩතල භාවිතය පිළිබඳ විස්තර කරන්න.

(ii) අද්‍යතන වන්නම් රචනාවීමට බලපෑ හේතු සාධක **තුනක්** සාකච්ඡා කරන්න.

(iii) විදේශීය නර්තන කලාව, දේශීය නර්තනයේ පැවැත්ම සහ ව්‍යාප්තිය කෙරෙහි අභියෝග එල්ල කරයි. විචාරන්න.

8. (i) රියැලිටි වැඩසටහන්වල භාවිත ආලෝකකරණය සහ ඩිජිටල් චේදිකා පසුතල ප්‍රේක්ෂක ආකර්ෂණය සඳහා දායකවන්නේ කෙසේ ද? විස්තර කරන්න.

(ii) රියැලිටි වැඩසටහන්වල අධ්‍යාපනික සහ සංස්කෘතික වටිනාකමක් තිබේ ද? ඔබගේ අදහස් දක්වන්න.

(iii) වෙස් මංගල්‍යය/පායිම්පත් මංගල්‍යය/ශිර්ෂාභරණ පැලඳවීම/කලඑළි මංගල්‍යය පැවැත්වීමේ නව ප්‍රවණතා සාම්ප්‍රදායික නර්තනයේ සංරක්ෂණයට හේතු වේ ද? විමසන්න.

PAST PAPERS WIKI
www.PastPapers.Wiki
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank

* * *